# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 19 දරන
# මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැ
පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00

## 1992 අංක 19 දරන මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 59/90

**මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් මෙතෙක් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී විද්‍යාලය පිහිටුවනු ලැබූයේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් කළමනාකරණ මණ්ඩලයක් විසින් කළමනාකරණය කොට සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද:

ඒ විද්‍යාලය/ආයතනය සංස්ථාගත කිරීමට එකී මණ්ඩලය විසින් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1\. මේ පනත 1992 අංක 19 දරන මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2\. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් "මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලයේ පාලක මණ්ඩලය" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. මන්ෆා-උල්-හුදා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.

3\. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් ඒවා විය යුතු යයි මෙසින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) තමන්ගේ මූලික ආගමික වතාවත් සඳහා වඩාත් පුළුල් අවස්ථා මුස්ලිම් ජනතාවට සලසා දීම;

(ආ) ආගම සම්බන්ධයෙන් උගතුන් (උලමාවරුන්) බිහිකිරීම; සහ

(ඇ) ෂරියා (ඉස්ලාම් නීතිය) සහ ඉස්ලාම් සංස්කෘතිය සංරක්ෂණය කිරීම වේ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක අඩංගු විධිවිධාන වලට යටත්ව විද්‍යාලයේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේද, ඇප ඇතිව හෝ නොමැතිව හෝ මුදල් ණයට ලබාගැනීමේ සහ එකතු කිරීමේ ද ප්‍රදාන සහ පරිත්‍යාග බාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව වෙත සතුකර දී ඇති හෝ පවරා ගෙන ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවක යන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව විද්‍යාලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා නංවාලීම සඳහා අවශ්‍ය හෝ උචිත කවර ආකාරයක හෝ සියළු ක්‍රියාවන් කිරීමේ ද කටයුතු ඉටු කිරීමේ ද ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

5. (1) පාලක මණ්ඩලය, නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීති වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූද ඒ රීති අනුව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත විය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ විද්‍යාලයේ පාලක මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) යම් වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවන ලද රැස්වීමකදී ඊට පැමිණ සිටින ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නො අඩු ඡන්දයකින් පහත දැක්වෙන සියළු කාර්යයන් හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) පාලක මණ්ඩලයේ සාමාජිකයින් තෝරා පත් කිරීම ;

(ආ) පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳව ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ දී දරන ලද වියදම් සංස්ථාවේ අරමුදල්වලින් ගෙවීම ;

(ඉ) බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඊ) සංස්ථාවේ නිලධරයන්ගේ සහ විවිධ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම ;

(උ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික වන කරුණු.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයින් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

විද්‍යාලය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති විද්‍යාලයේ සියලු ණය සහ වත්කම් මෙයින් සංස්ථාපනය වන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට විද්‍යාලයට අයවිය යුතු සහ ඊට ගෙවිය යුතු සියලු මුදල් හා සම්මාදම් මේ පනතේ කාර්යය සඳහා, සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි පූර්ණ බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. පාලක මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිටදී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එම සාධන පත්‍රයෙහි නම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කොටුපත්වල සහ පත්‍රවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.